## පාඩම - සොකරි කතා පුවත

දඹදිව කාසි රටේ ගුරුහාමි නම් ඇඹි ගුරෙක් වාසය කළා. රූමත් යුවතියක් වූ සොකරි සරණපාවා ගන්නා ගුරුහාමිගේ මෙහෙකරුවා වූයේ පරයා නම් පුද්ගලයෙකි. ජීවනෝපාය සඳහා රටින් රට යන ඔවුන් කෙළවරදී ලක්දිවට පැමිණේ. එහිදී මුහුදු සතක් තරණය කරන බවත් ශ්‍රීපාද ස්ථානයට ගොස් වැදපුදාගත් බවත් සඳහන් වේ. තඹරාවිට ගමට පැමිණෙන ඔවුන් එහි පැලක් සාදා වාසය කරයි. ගුරුහාමි බත් පිසිම සඳහා හාල් ගෙනත් දී වතුර සෙවීම සඳහා ගමට යන විට කකුළ බල්ලෙකු විසින් සපා කයි. අමාරුවෙන් ගෙදර පැමිණ වැතිර සිටින විට ගුරුහාමි මළා යයි සිතූ පරයා සොකරිය අනාචාරයකට පොළඹවා ගැනීමට උත්සාහ කරයි. කකුළ සුවපත් කිරීම සඳහා කැඳවා ගන්නා වෙදරාළ සමඟ සොකරි පළා යයි. සොවින් පෙළෙන ගුරුහාමි කතරගම දෙවියන්ට කන්නලව් කොට භාරහාර ඔප්පු කළ පසු ගුරුහාමිට වෙදරාළගේ ගෙදරදී ඇය හමුවේ. මේ වන විට ඇය දරුවකු ලබා නළවමින් සිටී. ( පාට වරුණ පුත - පරමණ්ඩල - පුත - නුඹ නාඩන් පුත - හරිරාරෝ ) දරුවා සමඟ සොකරිය නැවත භාර ගන්නා ගුරුහාමි දරුවා ප්‍රේක්ෂක ජනතාව අතට පත් කරයි. අවසානයේ දේව දානයකින් සොකරිය දරුවා ප්‍රේක්ෂකයන් අතට ලබා දිමෙන් සශ්‍රිකත්වය නැවත ජනතාවට ලබාදීම සංකේතවත් කරයි.

**<u>සුවිශේෂ තොරතුරු</u>**

01.සොකරි නාටකය උඩරට පළාතෙන් වන්නියෙන් සතරකෝරළේ ඇතැම් පෙදෙස්වලටත් සීමා වූවකි.

02.එහි විශේෂ ලක්ෂණයක් වන්නේ අනුරූපන මාධ්‍යයෙන් කතාවක් කීමයි.

03.කණ්ඩායම් නායකයා (බෙරකරු) කිසියම් සිද්ධියක් කවියෙන් විස්තර කරන විට නළුවෝ එය අණුකරනාත්මක නැටුමෙන් රඟ දක්වති.

04.ගද්‍ය සංවාද දක්නට ඇත.

05.සමහර වටින කොළපත් වලින් සාදා වෙස් මුහුණු පළඳිති.

06.උඩරට ගැට බෙරය තාල වාදනය සඳහා යොදා ගනියි.

07.සමහර පළාතක ඒ සඳහා දවුල භාවිතා කරන අතර වන්නියේදී උඩැක්කිය වයනු ලබයි.

08.සොකරි කතාව පළාත් බදව වෙනස් වේ.

09.සොකරි නාටකයේ මුල් ස්වරූපය තවම රඳා පවතින්නේ ලග්ගල ඉලුක්කුඹුර බදුල්ල වැනි ප්‍රදේශ වලයි.

10.අස්වැන්න කපා පාගා ගත් කමත සොකරි රංගනය සඳහා යොදා ගනී.

11.කෘෂි කර්මාන්තය හා සම්බන්ධ සශ්‍රිකත්වය හා බැඳී පවතින නාටකයක් ලෙස ද හැඳින්වේ.

12.මෙහි කතා පුවත පත්තිනි දේව ඇදහිල්ලට සම්බන්ධ වේ. එසේම කතරගම දෙවියන් පිළිබඳ සඳහනක් ද ඇත.

13.ශාන්ති කර්ම ස්වරූපයෙන් සොකරි නාට්‍ය අවසානයේ දේව දානයක් පිරිනැමීම ද කරනු ලැබේ.

14.තනු රටා උඩරට ශාන්ති කර්ම හා සම්බන්ධ වේ.

<u>පැවරුම -</u>

❖ ඉහත රංග සම්ප්‍රදාය ඇසුරින් පාසල් බිත්ති පුවත් පතට ලිපියක් සකස් කරන්න.